## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2020.03.12
## පළාත් ඉංජිනේරු කාර්යාංශය

2020 වර්ෂයේ පළමුවන කාර්තුවට අදාලව 2020.03.12 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

ඉන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරි කේ.ඩී.එල්.කඳනආරච්චි මිය විසින් පැමිණි සිටි නිලධාරින් සඳහා කරුණු පැහැදිලි කිරිමක් සිදු කරන ලදි.

**රැස්වීමට සහභාගී වූ නිලධාරීන්**

1. ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
2. ජී.ඩබ්.පී.පෙරේරා මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
3. සී.එස්.ලොකුගේ මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
4. කේ.ඩී.එල්. කඳනආරච්චි මිය- ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
5. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු- පළාත් ඉංජිනේරු කාර්යාංශය
6. එල්.එම්.ඩී.ආර්. ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
7. එච්.සී.ප්‍රේමතිලක මයා - අභ්‍යන්තර විගණන නිලධාරි - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
8. ජී.ඩී.විපුලසේන මිය- ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල
9. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම
10. එස්.ඩි.සේනාරත්න මිය- ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන
11. ආර්.එම්.ඒ.එස්.සකුන්තලා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ
12. ආර්.එල්.එන්.රාජපක්ෂ මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම
13. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම
14. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල
15. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ
16. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
17. එල්.බී.සම්පත් පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
18. එම්.ටී.එම්.ඩී.ශිවන්තිකා ජයවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
19. එච්.ඒ.ආර්.කේ.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ
20. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
21. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
22. ජේ.චමින්ද මයා - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
23. ජේ.ඒ.ඩී.තමරා මිය - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාලය - මිනුවන්ගොඩ

<u>සාකච්ඡා කළ කරුණු</u>

1. නව ගොඩනැගිල්ල ඉදිකිරීම භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ සෑම ගෙවීමක්ම පළාත් ඉංජිනේරු කාර්යාලයෙන් සිදු කරන බැවින්, එම කරුණුවලට අදාල විගණන විමසුම් පළාත් ඉංජිනේරු කාර්යාංශයට යොමු කිරීමට සිදු වන බව විගණන අධිකාරි විසින් පවසන ලදි. එනමුත් ගොඩනැගිල්ල සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ සිදු වී ඇති බැවින්, විගණන විමසුම් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට හැකි වන පරිදි ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡාකර ක්‍රමවේදය නිවැරදි කර ගන්නා ලෙසත් විගණන අධිකාරි විසින් දන්වන ලද අතර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු විසන් මේ පිළිබඳ අවශ්‍ය කටයුතු කරන බව පවසන ලදි .

2. පසුගිය වාර්තාවට අනුව දැනට පවතින විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රගතිය.

| | සාකච්ඡා වූ කාරණය | ගත් ක්‍රියාමාර්ගය | වගකීම |
|---|---|---|---|
| 1 | හිඟ විගණන විමසුම් පිළිබඳ<br><br>"Complain Management" විගණන විමසුම<br><br>පළාත් සභා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම | හෝමාගම ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයේ විගණකාධිපති විගණන විමසුමට අතුරු පිළිතුරක් ඉදිරිපත් කර ඇත.<br>ITRD ආයතනයෙන් කරුණු විමසා පිළිතුරු සැකසීමට කටයුතු සිදු කර ඇත.<br><br>පළාත් සභා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ විගණන විමසුම පිළිබඳව සාකච්ඡා කරන ලදි. | නි.ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍ර.ගණකාධිකාරි /ගණකාධිකාරි / මුලස්ථාන ඉංජිනේරු / අදාල ප්‍රාදේශිය ඉංජිනේරුවරු පරිපාලන නිලධාරි |
| 2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් ප්‍රා.ඉ.කාර්යාලවල තවදුරටත් පැවතීම.<br><br>හෝමාගම ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයේ දෙසැම්බර් 31 ලියූ චෙක්පත් බැංකුවට ඉදිරිපත් නොවී පැවතිම. | කාර්යාලවල රඳවා තබා ගෙන තිබූ චෙක්පත් පරීක්ෂාකර කඩිනමින් එම චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>අදාල විදුහලේ විදුහල්පති අසනීපව සිටි බැවින් එම චෙක්පත් රැගෙන යාමට නොහැකිවී ඇති අතර මේ වන විට එම චෙක්පත් රැගෙන ගොස් බැංකුගත කර ඇත. | ගණකාධිකාරි / පරිපාලන නිලධාරි<br><br>හෝමාගම ප්‍රාදේශිය ඉංජිනේරු |
| 3 | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ළහම , පාසල හොඳම පාසැල් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්වල , කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම. | අග්‍රිම ලබාදීමේදි ඇතිවී ඇති ගැටළුව හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති ඒකකය විසින් පොදුවේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දි ඇත. | සියළුම ප්‍රාදේශිය ඉංජිනේරු, |
| 4 | ඉදිරි වසර 5 සඳහා සැලැස්මක් සැකසීම. | පවතින තත්ත්වය හමුවේ දිර්ඝ කාලින ව්‍යාපෘති සැළසුම් කිරිම අපහසු බව සාකච්ඡා විය. | නි.ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) සියළුම ප්‍රාදේශිය ඉංජිනේරුවරු |

| | | | |
|---|---|---|---|
| 5 | ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ ඉංජිනේරුවරුන් හා කාර්ය මණ්ඩලය පුහුණු අවශ්‍යතාවයට පමුඛතාවය දීම. | තාක්‍ෂණ නිලධාරි/ සංවර්ධන නිලධාරි/ කළමනාකරණ සහකාර නිලධාරින් දැනුවත් කිරීමට ආදල තොරතුරු සම්බන්ධයෙන් පිරිස් හා පුහුණු අත්පොතට ඇතුලත් කිරීමට දන්වා යවා ඇත. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ගොඩනැගිලි අධ්‍යක්‍ෂ |
| 6 | හානි පාඩු සම්බන්ධව | හානි පාඩු සම්බන්ධයෙන් දැනට කටයුතු සිදු කරමින් පවතින අතර වාහන අනතුරු දෙකක කටයුතු අවසන් කර ඇත. | පරිපාලන නිලධාරි |
| 7 | අත්තිකාරම් බී ගිණුමට අදාලව ණය අය නොවීම. | අත්තිකාරම් බී ගිණුමේ ණය නිරවුල් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී | ගණකාධිකාරි / විෂය කළමනාකරණ සේවා නිලධාරි |
| 8 | කල් ඉකුත්වූ තැන්පතු | ප්‍රධාන කාර්යාලයේ කල් ඉකුත්වූ තැන්පතු නොමැති අතර ප්‍රාදේශීය කාර්යාල දෙකක කල් ඉකුත්වූ තැන්පත් තිබූ අතර එම තැන්පතු සම්බන්ධයෙන් තොරතුරු රැස්කරගනිමින් පවතී. | ගණකාධිකාරි |
| 9 | ප්‍රාදේශීය කාර්යාල 13 හි භාවිතා කරන ඉදිකිරීම් සම්බන්ධ ගොනුවල හා ආකෘති පත්‍රවල පොදු භාවයක් නොතිබීම. | පළාත් ඉංජිනේරු කාර්යාංශයට පොදුවන පරිදි ආකෘති පත්‍ර සකස් කිරීමට තොරතුරු එක්රැස් කර කටයුතු අවසන් කරමින් පවතී. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) |
| 10 | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 2020 වර්ෂය සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනය අනෙකුත් කාර්යාලවලට ලබාදීමට කටයුතු සිදු කර ඇත. | ගොඩනැගිලි අධ්‍යක්‍ෂ මූලස්ථාන ඉංජිනේරු ප්‍ර.ගණකාධිකාරි /ගණකාධිකාරි |
| 11 | වාහන අනතුරු අළුත් වැඩියා සඳහා වැයවූ මුදල් රක්‍ෂණයෙන් අයකර ගැනීම | PF 2886 හා PF 3043 වාහන අළුත්වැඩියා සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රමාණයම රක්‍ෂණයෙන් ගෙවා නොමැති බව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් පවසන ලදි එබැවින් රාක්‍ෂණ ආයතනයෙන් නොගෙවන ලද මුදල අදාල රියදුරුගෙන හෝ වගකිව යුතු නිලධාරිගෙන් අයකර ගැනීම හෝ කපාහැරීම සම්බන්ධයෙන් පරික්‍ෂාකර ඉදිරි කටයුතු කරන ලෙස පරිපාලන නිලධාරිට උපදෙස් දෙන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු |
| 12 | වාහනවල ඉන්ධන දහනය පරීක්‍ෂා කිරීම | වාහන දෙකක හැර අනෙකුත් සියළුම වාහන වල ඉන්ධන දහන පරීක්‍ෂා කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි වාහන දෙකෙහි ද පරීක්‍ෂණ කටයුතු අවසන් කර වාර්තා කරන ලෙස අදාල නිලධාරින් දැනුවත් කර ඇත. | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් හා පරිපාලන නිලධාරි |

| | | | |
|---|---|---|---|
| 13 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන යන ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල නිවස හා ඉඩම | දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නිත්‍යානුකුල අයිතිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වාර්තාව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.<br><br>අවිස්සාවේල්ල නිවස හා ඉඩම් ශ්‍රී ලංගම වෙතින් පවරා ගැනීමට ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් සූදානම් කර ඇත. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)<br><br>ඉංජිනේරු ආර්.ඒ.බී.රණසිංහ මයා |
| 14 | මතුගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ආක්ෂක සේවාව ලබා ගැනීම | වෙස්ප්‍රෝ ආයතනයෙන් අදාල ආරක්ෂක සේවාව ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස මතුගම ප්‍රාදේශීය ඉංජිනේරු දැනුවක් කර ඇත. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) පරිපාලන නිලධාරී ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම. |
| 15 | බියගම ප්‍රාදේශීය ඉංජිනේරුවරු කාර්යාලයට නව ගොඩනැගිල්ලක් කුලියට ගැනිම සම්බන්ධව | රන්මුතුගල සහතික කළ පාසැල් ඉඩමේ කොටසක් ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත. එතෙක් දැනට පවත්වාගෙන යන ගොඩනැගිල්ලෙම කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. | බියගම ප්‍රාදේශීය ඉංජිනේරු |

මිලඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා පාසැල් ඉදිකිරිම් සම්බන්ධයෙන් ඇති වී ඇති ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට අධ්‍යාපන අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේද වගකිව යුතු නිලධාරින් කැඳවිම සුදුසු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු ඒ.ඒ.පී.එස්.කේ.කරුණාරත්න මයා විසින් ප්‍රකාශ කරන ලදි.

අධ්‍යක්ෂ ඉංජිනේරු ජී.ඩබ්.පී.පෙරේරා මිය විසින් ස්තුති කතාව සිදු කර රැස්වීමේ කටයුතු පස්වරු 1.00 ට පමණ අවසන් කරන ලදි.

ඒ.ඒ.පී.එස්.කේ.කරුණාරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
පළාත් ඉංජිනේරු කාර්යාංශය
බස්නාහිර පළාත.

ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
පස්වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.